# කාව්‍ය සමීක්ෂා

## මංගල කලාපය

### දේශජ කාව්‍ය උරුමයේ පරිණාමය, අභියෝග හා පුනර්ජීවය

සංස්කරණය
මහාචාර්ය කමල් වලේබොඩ
මහාචාර්ය ස්වර්ණා ඉහළගම
ආචාර්ය විමල් හේවාමානගේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කල්‍යාණි විජේසුන්දර
සහකාර කොමසාරිස් ප්‍රදීප් ඉඳුනිල් පියරත්න
සහකාර කථිකාචාර්ය වයි. ඩී. ප්‍රියංකර

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

කාව්‍ය සමීක්ෂා
මංගල කලාපය

© සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය: 2019 මාර්තු

ISBN 978-955-3748-29-4
වලේබොඩ, කමල්
ඉහළගම, ස්වර්ණා
හේවාමානගේ, විමල්
විජේසුන්දර, කල්‍යාණි
පියරත්න, ප්‍රදීප් ඉඳුනිල්
ප්‍රියංකර, වයි. ඩී.

ප්‍රකාශනය
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කංචුක නිර්මාණය
නලීන් සම්පත් කරුණාසේන

මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගම
44 උඩහමුල්ල දුම්රියපොළ පාර,
නුගේගොඩ.

මෙම ලිපි සරණියෙහි අන්තර්ගත ලිපිවල එන අදහස් ඒ ඒ රචකයන් සතුය. තවද මෙහි අක්ෂර වින්‍යාසය යොදා ඇත්තේ ද ඔවුන් පිළිගත් මත ගුරුකොට ගෙන බව සැලකුව මැනවි.

15. **දහනවවන සියවසේ ක්ෂණික කාව්‍යබන්ධන ආශ්‍රිත සමාජ දෘෂ්ටිය** 100

**ඔලගන්වත්තේ චන්‍දසිරි හිමි**
බී. ඒ. ගෞරව, එම්. ඒ. (ජ'පුර), පී.එච්.ඩී. (පේරාදෙණිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, රජරට විශ්වවිද්‍යාලය

16. **විවාහය කේන්ද්‍රගත ජනකවි විවරණ** 110

**එම්. ජී. එම්. ජේ. විමලසිරි**
බී. එෆ්. ඒ. ගෞරව (සෞන්දර්ය කලා)

17. **හිටිවන කවියේ විරිත් භාවිතය** 118

**කල්‍යාණි හේරත් මැණිකේ**
බී. කොම්. (ජ'පුර), එම්. එස්. එස්. සී. (කැලණිය), එම්. ඒ. (රාජ්‍ය පරිපාලන ආයතනය) ජ්‍යෝතිර් මහෝපාධ්‍ය (ඉන්දියාව), ජ්‍යෝතිර්වේදී, ප්‍රවීණ හිටිවන කිවියර, ග්‍රන්ථ කර්තෘ

18. **හිටිවන කවියේ කාව්‍යාලංකාර භාවිතය** 128

**වයි. ඩී. ප්‍රියංකර**
බී. ඒ. ගෞරව (කොළඹ), සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

## කොළඹ කවියේ සමාජ භාවිතය

19. **කොළඹ කවියේ ආවේණික ලක්ෂණ හා සමාජ බලපෑම** 135

**දීපචන්දි අබේසිංහ**
බී. ඒ. ගෞරව (කැලණිය), එම්. ෆිල්. (කොළඹ), කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

20. **ජාතික අරගලය සහ කොළඹ යුගයේ වැඩිහිටි කවි පරපුර** 144

**පී. එම්, සේනාරත්න**
ප්‍රවීණ ග්‍රන්ථ කර්තෘ, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී, රූපවාහිනී සංස්ථාවේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්

21. **වාමාංශික ව්‍යාපාරය සහ කොළඹ කවිය** 149

**ප්‍රදීපා සංජීවනී දිසානායක**
බී. ඒ. ගෞරව (කොළඹ), එම්. එස්. එස්. සී. (කැලණිය), කථිකාචාර්ය, ශ්‍රීපාලි මණ්ඩපය, ජනමාධ්‍ය අධ්‍යයනාංශය, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

22. **ගීතයේ ගමන් මඟ අවදි පෙහෙළි කළ කවිය** 162

**බණ්ඩාර ඇහැලියගොඩ**
බී. ඒ. ගෞරව (පේරාදෙණිය), රාජ්‍ය සම්මානලාභී ගීත රචක, ප්‍රවීණ කිවියර

23. **කොළඹ යුගයේ කවිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජ ස්තරායනය** 166

**හංසමාලා රිටිගහපොල**
බී. ඒ. ගෞරව, එම්. ඒ., ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාද් උපාධි ඩිප්ලෝමා (ජ'පුර), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

24. **පහතරට ශාන්තිකර්ම කාව්‍යයන්හි අන්තර්ගත විශේෂතා** 172

**ලයනල් බෙන්තරගේ**
බී. එෆ්. ඒ. ගෞරව (කැලණිය), එම්. ඒ., පී. එච්. ඩී. (ජ'පුර), මහාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# 23

# කොළඹ යුගයේ කවිය සහ ස්ත්‍රී-පුරුෂ සමාජ ස්තරායනය

හංසමාලා රිටිගහපොළ

## හැඳින්වීම

'කොළඹ යුගය' සෙසු යුගවලට සාපේක්ෂ ව විවිධත්වයෙන් හා වෙනස් ලක්ෂණවලින් අනූන වූ යුගයකි. පෘතුගීසි, සහ ලන්දේසි පාලන කාලවකවානු තුළ වුව යම් තරමකින් ශේෂ වී තිබුණු සාම්ප්‍රදායික සිංහල සමාජය ඉංග්‍රීසි යටත්විජිතයක් බවට පත්වීමත් සමඟ ම ඉතා වේගයෙන් බටහිර වාණිජ රැල්ලට ලක් වූයේ ය. කොළඹ යුගයේ සාහිත්‍ය බිහිවන්නේ මෙකී නව පසුබිම තුළ යි. ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් වෙනස්කම්වලට ලක් වූ පසුබිමක බිහි වූ කොළඹ යුගයේ සාහිත්‍යය, අවශේෂ සාහිත්‍ය යුගවලින් ඉඳුරා වෙනස් වන බව පැහැදිලි ය. 1815න් ඇරඹෙන මෙ සමය නූතන සාහිත්‍යයේ සමාරම්භය ලෙස විචාරකයන් පෙන්වා දෙන්නේ එබැවිනි. මෙසේ නව සාහිත්‍යාංගවලින් ද සමන්විත ගද්‍ය සාහිත්‍යයක් සහිත කොළඹ යුගයේ වඩාත් ජනාදරයට පාත්‍ර වූයේ එම යුගයේ බිහි වූ පද්‍ය සාහිත්‍යය හෙවත් 'කොළඹ කවිය' යි. මෙම ලිපියේ අභිමතාර්ථය වනුයේ සමාජ විෂයක සංකල්පයක් වන සමාජ ස්තරායනයේ සත්‍රී-පුරුෂ ස්තරායනය, කොළඹ කවිය හා බද්ධ කොට සාකච්ඡා කිරීමයි. සමාජ ස්තරායනය යන සංකල්පය සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ බහුල ව භාවිත වන සංකල්පයකි. ඕනෑම සමාජයක පුද්ගලයන් අතර කුල, ආගම, ජාතිය, වර්ණ භේදය. ලිංගිකත්වය, වයස, පංතිය යනාදිය පදනම් කර ගෙන ඇති වෙන විෂමතාව හේතුවෙන් සමාජය තුළ සමාජ ස්තරායනයක් ගොඩ නැඟී ඇත. සමාජ විද්‍යා ශබ්දකෝෂය මෙම යෙදුම අර්ථ දක්වන්නේ බලය, වස්තුව, දේපළ හා ගරුත්වයෙහි වෙනස මත සමාජය විවිධ තලවලට වෙන් කරන ආකෘතියක් ලෙස ය. 'Stratification' යන ඉංග්‍රීසි පදය භූ විද්‍යාවෙන් භාවිතයට ගත් 1940 සිට සමාජ විද්‍යා ක්ෂේත්‍රය තුළ පරිශීලනයට පැමිණි පදයක් බව අන්තර්ජාතික සමාජීය විද්‍යා විශ්වකෝෂය සඳහන් කර ඇත. සමාජයක් තුළ ස්තරායන සාධක ගණනාවක් දැකිය හැකි වුව ද ශ්‍රී ලංකා සමාජය තුළ ඉතා වැදගත් ස්තරායන සාධක ලෙස ගැනෙන්නේ ස්ත්‍රී - පුරුෂ භේදය හෙවත් පුමතිරිබව, කුලය, ජනවාර්ගිකත්වය හා පංතිය යි. ඒ අනුව මෙහිලා විමර්ශනය කෙරෙනුයේ එකී ස්තරායන සාධක අතුරින් ස්ත්‍රී පුරුෂ ස්තරායනය කොළඹ යුගයේ කවියෙහි නිරූපණය වන ආකාරය යි.

## ස්ත්‍රී පුරුෂ ස්තරායනය

ස්ත්‍රී - පුරුෂ භේදය, කුලය, වර්ණ - වර්ගවාදය ආවෘත ගණයේ සමාජ ක්‍රම තුළ දැකිය හැකි ස්තරායන මාන වේ. උක්ත මානවල අනම්‍ය ස්වරූපය හා ආරෝපිත ස්වභාවය ඊට හේතු සාධක වී ඇත. මෙම සියලු මාන තීරණය වන්නේ උපතට සාපේක්ෂ ව යි. යම් පුද්ගලයෙක් ජන්මයෙන් ස්ත්‍රී - පුරුෂ බව ද සිය කුලය හා වර්ණය - වර්ගය එනම් ජාතිය ද රැගෙන එයි. එම සාධක අනම්‍ය වූ ස්වරූපයක් දරන බැවින් වෙනස් කිරීමේ හැකියාව ඉතා අවම මට්ටමක පවතී. ස්ත්‍රී - පුරුෂ බව හෙවත් 'පුම්තිරිභාවය' යනු සමාජීය වශයෙන් පිරිමි හා ගැහැනුන් අතර දක්නට ලැබෙන වෙනස නිසා ඇති වන්නකි. සාමාන්‍යයෙන් මෙම දෙපිරිස අතර ඇත්තේ ශාරීරික හා ජීව විද්‍යාත්මක වෙනසකි. එම ජීව විද්‍යාත්මක වෙනස්කම මත එකී දෙපිරිසෙහි අයිතිවාසිකම් තීරණය වන බව සමාජයේ මුල් බැස

ගත් අදහසක් විය. ස්තරායන මානයක් ලෙස ස්ත්‍රී - පුරුෂ බව හෙවත් 'පුම්තිරි' බව වැදගත් වන්නේ, එය එක් පාර්ශ්වයක් පීඩනයට පත් කිරීමට අනෙක් පාර්ශ්වයේ ක්‍රියාකාරීත්වය හේතු වන නිසා ය. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය තුළ ගැහැනු දරුවා දෙමාපිය ආරක්ෂාව යටතේ ජීවත් විය යුතු විය. විවාහයේ දී කාන්තාව සිය පුරුෂයා හා ඇගේ ඥාතීන් සමඟ පදිංචියට යාම සිදු වූ අතර දීග විවාහය ලෙස මෙය නම් කෙරිණ. මේ තුළින් පුරුෂාධිපත්‍යය තහවුරු වන බව ඇතැම් අයගේ මතය යි. ඒ අනුව විවාහය වූ කලි එතෙක් පියා යටතේ රක්ෂා වූ ස්ත්‍රියගේ භාරකාරත්වය යම්කිසි පුරුෂයෙකුට පාවා දීම ය. කපිල ඊ. සෙනෙවිරත්නගේ 'අම්මා හා දියණිය' නමැති කවි පෙළෙහි එන අදහස් මීට සමාන ය.

අම්මා - දැරියක් හැබෑ නම් උඹ කියතත් මොනවා - කවදා නමුත් වෙන කෙනෙකුට හිමි වෙනවා
ඒවා සිරිත් කවදත් ලොව පවතිනවා - ඉඳ හිට උඹ බලන්නට මම එහි එනවා

දූව - මා හෙට උදේ කාටද පාවා දෙනවා - ඉන්පසු ඒ අයට මගෙ බර හිමි වෙනවා
අම්මා මේ ගෙදර තනියම නවතිනවා - මේ ගැන මතක් වන විට හදවත දනවා

මව විවාහය සිරිතක් ලෙස විග්‍රහ කරන විට දියණිය එය දකින්නේ ඇගේ බර හෙවත් ඈ පිළිබඳ වගකීම කිසියම් කෙනෙකුට පවරා දීමක් ලෙස ය. සංවාදයක් ලෙස දිග හැරෙන මෙම කවි පංතියේ නැන්දම්මා - ලේලි අරගලය ගැන පැවසේ.

දූව - කොපමණ අම්මලා සිටියත් රටෙහි අද - අම්මා වගේ මට ඒ අය වටිනවද
ලේලිය දකින කොට පුපුරා හැළෙන තද - නැන්දම්මලා ගැන මොනවට කියනවද

ස්ත්‍රී - පුරුෂ ස්තරායනයේ දී ස්ත්‍රිය පහත් කර දැක්වීමේ ක්‍රියාවලියේ මූලිකත්වය ගෙන ඇත්තේ පුරුෂ පාර්ශ්වය පමණක් නොවේ. ඒ සඳහා ඈත අතීතයේ සිට අනියමින් ස්ත්‍රිය ද දායකත්වය සපයා ඇති බවට ලැබෙන නිදසුන නම් මෙම නැන්දම්මා - ලේලි අරගලය යි. මෙහි දී ද කවියා විවාහප්‍රාප්ත වීමේ අභිලාෂයෙන් සිටින මෙම තරුණියගේ මුවගට නගා ඇත්තේ ස්ත්‍රී වර්ගයා තුළ නැන්දම්මා කෙරෙහි වන අප්‍රසාදය යි.

කාන්තාව ලිංගික සූරා කෑමට ලක් වන ආකාරය විෂය කර ගනිමින් පී. බී. අල්විස් පෙරේරා විසින් 'ලේ මස් පූජාව' කවි කතාව රචනා කර ඇත. මේ වනාහි කොළඹ යුගයේ ප්‍රකට ව පැවති කවි කතා අතරට ගැනෙන්නකි. මෙහි කතා නායක - නායිකා යුවළ සිරිමල් හා ලීනා ය. සිරිමල් කම්කරුවෙකු ලෙස රිටිගල වතුයායට රැකියාවට පැමිණෙන අතර වතු අයිතිකරුගේ පීඩනයට ඔවුහු ලක් වෙති.

රිටිගල යාය වැනසූ ගම් හිමි ව සිටී - වැසියෝ සිටිති අද බැල මෙහෙවරට වැටී
රූපත් තරුණ ගැහැනුන් වැනි පිළිම මැටී - කෙළි බඩු වගෙයි දනපති ලෝකයෙහි සැටී

මසකට වරක් වතුහිමියා විත් නැවතී - කැඳවන්නේ ය හමුවට එක් එක් යුවතී
දුප්පත් මව්පියෝ දූ දරුවන් එවතී - මේ කැත සිරිත නිතර ම රිටිගල පවතී

ධනය හා බලය අයුතු ලෙස භාවිත කරමින් ඒ මගින් කාන්තාව ලිංගික සූරා කෑමට ලක් කිරීම ස්ත්‍රී - පුරුෂ ස්තරායනයේ දී නිරන්තරයෙන් ම දැකිය හැකි වන්නකි. පුරුෂ මූලික සමාජය තුළ කාන්තාව පුරුෂයන් විසින් කෙළි බඩු ලෙස භාවිත කරනු ලැබීම මෙහි දී විචාරයට ලක් වන්නේ ය.

හිරු බැස යන විට දි ලීනා මෙහි ඒවා - යනුවෙන් නිවේදනයක් පිට වී ආවා
ඈ දිය හැකි ද සල්ලාලයකුට පාවා - අසරණ - දුබල සිරිමල් දත් මිටි කෑවා

විරිඳුව නැගුණ විට මේ දනපතියාට - සිදුවන දෙය දනී ඔහු නිසැක ව රැට
සිය මළකඳ පවා මුණ නොගැසෙයි ඈට - ඉන්පසු කුමක් වේවිද පොඩි දරුවාට

බලය හිමි පංතියට විරුද්ධ ව නැගී සිටීමට ඇගේ සැමියාට නො හැකි ය. පුරුෂ මූලික සමාජයට විරුද්ධ වීමේ හැකියාව තනි පුරුෂයෙකුට හිමි වන්නේ නැත. එය සමාජගත කොට ඇත්තේ

බලය හා තිලය ද කේන්ද්‍ර කර ගනිමිනි. ඒ අනුව එයට එරෙහි වන්නාට අත් වන්නේ මරණය යි.

මගෙ ලේ මසින් සැනසෙන්නට යකෙකු වගේ - ඌ මඟ බලා ඇත දල්වා නයන යුගේ
වළහන්නට නොහැක හිමියනි, ගමන මගේ - නො තබනු ඉතින් ඔබෙ අත මේ කිළිටි ඇගේ

ඇයට සිය පවුලේ අනාගතය වෙනුවෙන් ස්වකීය පෞද්ගලිකත්වය විනාශ කර ගැනීමට සිදු වී ඇත. ස්ත්‍රිය ලිංගික සූරා කෑමට ලක් වන අයුරු පෙන්වා දීම කවියාගේ අරමුණු වී ඇති බව පෙනේ. ජෝන් රාජදාස කවියා සංස්කරණය කළ 'මී වදය සඟරාවේ කාන්තාව කේන්ද්‍ර කරගනිමින් ගෙන ගිය වාදයක් දැකිය හැකි විය. මෙබඳු කවි වාද එවක ඉතා ජනප්‍රිය ඒවා විය. මේ වූ කලි ''ස්ත්‍රී රත්නවාදය යි. 'ස්ත්‍රිය රත්නයකි; ස්ත්‍රිය රත්නයක් ද ?' යන මැයෙන් වූ සංවාදයට බටුයේ එච්. එම්. කුඩලිගම සහ මීමන ප්‍රේමතිලක යන කවීහු ය. ස්ත්‍රියට විරුද්ධ ව මීමන ප්‍රේමතිලක පෙනී සිටි අතර කුඩලිගම කවියා ස්ත්‍රිය රත්නයකි යන මතය නියෝජනය කළේ මෙසේ ය.''

රසයක් නො හඳුනන ගත්කරුවෝ නිවට - ඇය පිළිකුලක් කොට පෙන්වති මුළු ලොවට
සැහැසිම මිනීමරුවා ඇයගේ රුවට - පෙරළෙයි අහිංසක පොඩි දරුවෙකු බවට

අඩපණ වුණොත් ඒ මුළු ලොව රකින අත - කිසි ගුණ වගාවක් ඉස්මතු නොවනු ඇත
කවදා කොතැන හෝ මේ මහ පොළොව මත - කවියක් කලාවක් ඇය නැති තැනක නැත

කුඩලිගමට එරෙහි ව මීමන පවසන අදහස් මෙ බඳු ය.

මුවගෙහි එකකි වෙන අනිකකි ඇයගෙ හදේ - කිසිවිට අවංක ව වචනය පිටත නොදේ
මේ රත්නයට වැඩියෙන් අප දමන වදේ - මට දැලි අඟුරු යහපති දත මදින උදේ

කුඩලිගම කවියා එයට ප්‍රතිප්‍රහාර දෙමින් පවසන්නේ යම් අයෙක් කවියෙකු වීමට කැමැත්තේ නම් පළමු කොට කළ යුත්තේ කාන්තාවකට ආලය කිරීම බව යි. එසේ ම ඈ නො මැති තැන කවි රස පහළ නො වන බව යි.

කවියකු වනු කැමැත්තෙහි නම් පළමු කොට - ආලය කරන්නෙකු වනු ඉතිරියක හට
අද මේ මහා කවි නීතිය ඉදිරිපිට - ඔබ අසරණ වුණා කනගාටුවකි මට

කවියේ කලාවේ අදිපති බලය ලොවේ - ඉතිරියකගේ දෙව්කම පිට තව ම යැවේ
ඇය නො රැඳෙන තැනක කවිරස පහළ නොවේ - ගීයේ මුල් උපත විය ඉතිරියක දිවේ

මීමන ප්‍රේමතිලක ඊට පිළිතුරු දෙන්නේ පහත දැක්වෙන කවි රචනා කරමිනි.

ගැහැනුන් වගේ නැත බොරු පිළිසඳර කතා - වනමල් සුළං වන බඹරුන් තුරු ද ලතා
මගෙ කවිකමට මුල් විය මුල සිට ම ඉතා -එහෙයින් පලක් නැත මට ගැහැනියක පතා

කවිකම සමඟ ඉතිරිය එක තැන හමුවේ - යන ඔබ මතය මහ බොරුවකි අමු අමුවේ
ගුත්තිල කතුතුමා සහ හිමි තොටගමුවේ -ඉතිරියගෙන් ද මහ කවි රස පිරි නැමුවේ

ආනන්ද රාජකරුණා කවියා ද 'උපදේශ' නම් කාව්‍ය පංතියේ අන්තර්ගත විවිධ උපදෙස් අතරෙහි පුරුෂයා ස්ත්‍රියට වඩා උතුම් බව පවසා ඇති අයුරු දැකිය හැකි ය.

ලියක් නුනුවණ යා - අවාදොරට ම ගෙන යා
හිමි නැණැ'ති තැන යා - සග දෙසට ඔහු කැටිව පැනයා

අඥාන ස්ත්‍රියක වේ නම් ඈ සිය පවුල රැගෙන යන්නේ දුගතියට ය. එහෙත් ඥානවන්ත පුරුෂයා එසේ නො වේ. ඔහු වසන තැන සුගතිය වන අතර ඇය ද ඔහු සමඟ එක් වනු දැකිය හැකි

වේ. කවියා සාමාන්‍යයෙන් ගැහැනිය වනාහි නුවණින් මඳ අයෙකු ලෙසත් පුරුෂයන් ඥානයෙන් අග තැන්පත් වුවන් ලෙසත් දැක්වීමට උත්සාහ දරා ඇති බව පෙනේ.

පියදාස සිරිසේන වූ කලි බටහිර සංස්කෘතිය හේතුවෙන් විවිධ විපර්යාසයන්ට ලක් වන කාන්තාව සුසිරිත කෙරෙහි නැවත නැඹුරු කරවීම පිණිස විවිධ සාහිත්‍ය කෘති සම්පාදනය කළ සාහිත්‍යධරයෙකි. ඔහු විසින් ඔසවා තබන ලද්දේ සිංහල සංස්කෘතියෙන් පෝෂණය ලද වචනයේ පරිසමාප්ත අගයෙන් ම හෙළ කුල කතක වූ ස්ත්‍රී ප්‍රජාව පමණි. ඔහු කුල කාන්තාවන් ලෙස නො අනුදත් ස්ත්‍රීන් ඔහුගේ නිර්දය විචාරයට පාත්‍ර විය.

අහරටරිසි නමුත් රසවත් ඔද වැඩෙන - බැරිවිට ඔය ලැබුම අත මීට හිඟ වෙමින
හිම්හටමිග කියන ගරහන දිගැසියන - පොළොවට බරව ඉපදුන යකිණියෝ වන

ගමන් බිමන් ගියමුත් දන ඇති දවස - එමෙන් යන්ට අසරණ කල වී සතොස
හිමින් හට බනින කරදර කරන රොස - ලියන් සැපිනියන්ම ය දනු මෙ ලෝ කුස

ගුණවත් පුරුසයෙකු දුදනෙකු කිරීමට - නැණවත් අයෙකු යළි පිස්සෙකු කිරීමට
සැපවත් ලෙස විසූ අය දිවි නැසීමට - සුරු වෙත් රුදුරු ලිය මෙ ලොවෙහි ම කදිමට

සිරිසේනට අනුව ඔහුට අනභිමත ගැහැනිය වනාහි යකින්නකි; සැපින්නකි; යහපතින් අයහපතට හෙළන දුදන ගති ඇත්තියකි. ඔහු උක්ත කාව්‍ය පංතිය නම් කර ඇත්තේ 'ස්ත්‍රීන්ගෙන් පීඩා විඳින්නන්ට හා විවාහපේක්ෂිතයන්ගේ ප්‍රවේශම් වීම සඳහා' යනුවෙනි. මේ සියලු අදහස් අනුව පැහැදිලි වන්නේ පුරුෂයා වනාහි යහපත් ආකල්පවලින් යුතු ගුණගරුක පුද්ගලයෙකු වන අතර සෑම විට ම ඔහුගේ අහේතුවට නිදාන වන්නේ ගැහැනිය බව ය. එමෙන් ම අභිනව සමාජය සමඟ වෙනස් වන්නා වූ ගැහැනිය පියදාස සිරිසේන කවියාට අරුචි ය. සාම්ප්‍රදායික සිංහල සමාජයේ දැකිය නො හැකි තරමට ම ස්ත්‍රිය වෙනස් වෙමින් පවතින බව කවියාගේ නිරීක්ෂණයට ලක් වී තිබිණ. ඒ නිසා ම ඔහු එයට විරුද්ධ ව නැගී සිටියේ ය. එතෙක් ගේ මුල්ලට සීමා වන ස්ත්‍රිය ලොව හමුවට යෑමෙන් සිදු විය හැකි යහපතක් නො දකින්නට තරම් සාම්ප්‍රදායික පුරුෂ චිත්තය ඔහු අබිබවා ඇත. ඒ බව ඔහුගේ පහත සඳහන් කවිවලින් ද මනා ලෙස ගම්‍ය වේ.

ඉතිරින් ලිපිකරුන් කොට පිටත යවමින - පිරිමින් ගෙදර කටයුතු කෙරුමට සිතන
මිනිසුන් වසන රටකට ඉර හඳ දෙදෙන - කෙළෙසින් එළිය දෙනුදැයි සිතුම බැරි වන

ලියෙකුගේ මෙහෙය මිනිසා භාර ගෙන - මිනිසාගේ වැඩෙහි ලොව ඉතිරින් යොදන
මෙම රගේ 'උගත් වියතුන්ගෙන්' ගහන - කලියුගේ හැටිය කවුරුත් බලනු මැන

ආනන්ද රාජකරුණාගේ 'මම කෙබඳු වනිතාවක් ආවාහ කරන්නෙම් ද?' කවි පෙළ වූ කලි විවාහාපේක්ෂිත තරුණියක තුළ පැවතිය යුතුයැයි පුරුෂ සමාජය විසින් තීරණය කරනු ලබන ලක්ෂණවලට අනුගත ව රචනා කරන ලද්දකි. ඒ අනුව සාම්ප්‍රදායික සමාජයක් තුළ පුරුෂ පාර්ශ්වය විසින් කවර අන්දමේ තරුණියක සිය අනාගත බිරිඳ බවට පත් කර ගනු ලබන්නේ ද යන්න සිතා බැලීමට මෙකී කාරණා හේතු සාධක වේ යැයි කවියා අනුමාන කරන්නේ ය.

කළ මිණි කිරුළ තෙ රුවන මතඟ මත දැරූ - නළ ලත තිබඳ සිහි නැණ තිලකාව පිරූ
ලෙල හිරි ඔතප් කොඩොලින් යුග සවන සැරූ - ගෙල සුවිනීත ගති මුතුහර බන් මහරූ

දිගැසක් සරණ කර ගන්නෙමි නම් එකලේ - සැපසක් විති බජන්නෙමි ම දිවි සක්වලේ
සලිලක් දිව සොබන ඉතිහස දපණ තලේ - යුවළක් මහරු පිළි රූ එහෙයින් ම දිලේ

කාන්තාවක විසින් දිවි හිමියෙන් කුමරි බඹසර ආරක්ෂා කිරීමේ වැදගත්කම දැක්වීම උදෙසා රාජකරුණා 'කුමාරි බ්‍රහ්මචර්යාව' රචනා කොට ඇත. ස්ත්‍රිය පළමු ව කන්‍යාභාවය රැක ගතයුතු ය.

විවාහයෙන් පසු පතිවත රැක ගත යුතු ය. යම් කාන්තාවක කුමරි බඹසර රකින්නේ නම් නිසැකයෙන් ම ඉටු දෙව්දුව ඇ වෙත වසන බව කවියා පිළිගත් මතය යි. එහෙත් එ බඳු කාන්තාවකගේ කුමරි බඹසර බිඳදැමීම සඳහා අනංගයාගේ පංච මල්සර ඇ වෙත යොමු වන බවත් ඊට පෙලඹෙන වනිතාව සලෙළු පාශයෙහි ඇලීම හේතුවෙන් ඉටු දෙව් දූ ඇ හැර යන බවත් කවියාගේ අදහස ය.

සුරකින කුමරි බඹසර එම කුල දේවී - බිඳලන පිණිස පසසැර සැර විදලාවී
පහරින නපුරු ඇගෙ ගත සැලෙන සෙවේවී - කුමකින එසිදු වෙද ඔවුනට නො හැඟේවී

පසුවී මෙලෙස සලෙළකු පියොවෙහි නැවත - හසුවී අනඟ රස වළඳන දිගැස වෙත
සෙසුවී ඉතිරි ගුණ නැති බැව් රැගෙන සිත - මුසුවී දුකින් ඉටු දෙව් දුව පළා යත

ඉෂ්ට දේවතාවිය එම කාන්තාව හැර දමා යෑමට හේතුව ලෙස කවියා දකින්නේ සලෙළකු සමඟ අනඟ රස විඳීමෙන් ඇගේ ස්ත්‍රී ගුණ ඇ තුළ ශේෂ ව නො මැති වීම ය.

එසේ වුව ද කුඩලිගම සිය ප්‍රගතිශීලි දෘෂ්ටිය කාන්තාව කෙරෙහි යොමු කළ අවස්ථාවක් ලෙස 'ගැහැනිය' කවි පන්තිය හැඳින්විය හැකි ය. කාන්තාවක ස්වකීය ජීවිත කාලය පුරා අත් විඳින දුක් වේදනා සමූහය ඊට වස්තු විෂය වී ඇත. කවියා පවසන්නේ ජීවිතය පුරා දුක් විඳින අසරණ ගැහැනියක ගැන ය.

ඇඳහිලි නමැති යදමින්, ගැට ගැසුන ගෙල - හිර වී කුල සිරිත් පිළිබඳ කුළුන මුල
කිසියම් මිනිහකුට මෙහෙවර පිණිස බැළ - ඈ ජීවත් වුණා හැටැඳිරි මැදිරිවල

මුළු ජීවිතය කැප කොට නො ගෙවන පවට - හිත් පිත් දෙක ම නැති බඩුවක් සේ නිවට
ඈ පෙරළී ගියා මේ කෑදර ලොවට - පැක්ටේරියක් - වත්තක් - කුඹුරක් බවට

සමාජ විශ්වාස, සිරිත් විරිත් මැද පුරුෂයාගේ බැළ-මෙහෙවර පිණිස කැප වුණු ගැහැනියගේ දිවිය අවසානයේ සේවය සැපයීම සඳහා ම පරිවර්තනය වූ බව කවියා මෙම කවි පන්තියෙන් පෙන්වා දෙයි.

**සමාලෝචනය**

මෙසේ උත්පත්තියෙන් ආරෝපණය වන ස්ත්‍රීත්වය හා පුරුෂත්වය මත ලිංගිකත්ව භූමිකාව අයත් කර ගැනීම තීරණය වීම හේතුවෙන් ස්ත්‍රියට ආරෝපිත සමාජයෙන් හා සංස්කෘතියෙන් සිදුකරන ලද බලපෑම කොළඹ යුගයේ කවියෙහි නිරූපණය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. ආරම්භක සමයේ දී කොළඹ යුගයේ කවියන් ගෙන ගිය සමාජ සංශෝධනාත්මක ක්‍රියාවලියේ ස්ත්‍රිය යහමගට හැඩ ගැස්වීම ද ඇතුළත් විණ. එහෙත් පසුකාලීන ව ඒ වෙනුවට 'ස්ත්‍රිය ගර්භාවට ලක් කිරීම', උක්ත වාද - විවාදවලින් සිදු වූ බව පෙනේ. කෙසේ වුව ද බටහිර සංස්කෘතිය හා බටහිර මත වාද අනුව කෙමෙන් වෙනස් වීමට බඳුන් වූ ලාංකේය ස්ත්‍රිය කෙරෙහි යොමු වූ සතුරු - මිතුරු දෘෂ්ටිකෝණයන්ගෙන් කොළඹ යුගයේ කවිය පොහොසත් විය. ඉතිඳු වැඩි වශයෙන් ම දැකිය හැකි වූයේ සතුරු පාර්ශ්වය යි. පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා වැනි කවියන්ට නව සංස්කෘතිය හා මිත්‍ර වීමෙන් ස්වාධීන වන්නට තැත් දැරූ කාන්තාව රුචි වූයේ නැත.ඔවුහු කුල භේදය, පංති භේදය හෙළා දුටුවෝ ය. ස්වකීය ජාතිය නැංවීමෙහි ලා පෙරමුණ ගත්තෝ ය. එහෙත් කාන්තාව අරභයා පමණක් සාම්ප්‍රදායික මතවලට ගරු කළෝ ය. මෙසේ ක්‍රමයෙන් වාණිජකරණයට හා වෙනස්වීමට බඳුන්වන සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ කාන්තාවට හිමි වූ ආස්ථානයත් ඇය එකී සමාජ ක්‍රමයේ ම ගොදුරක් වූ අවස්ථාත් කොළඹ කවියෙන් දැකිය හැකි වීම විශේෂත්වයකි. සාම්ප්‍රදායික සිරිත් විරිත් අනුදත් සමාජ ක්‍රමයක් තුළ පිරිමින්ගේ පමණක් නො ව බොහෝ විට වෙනත් ස්ත්‍රියක හෝ ස්ත්‍රීන්ගේ බලපෑමට, පීඩනයට ලක්වීමට ද ඇතැම් කාන්තාවන්ට සිදු වී ඇති බව පෙනේ.

එනයින් බලන කල කොළඹ යුගයේ කවියට පාදක වී ඇත්තේ විවිධ අභියෝග මධ්‍යයේ වෙනස්වීම්වලට ලක් වූ ශ්‍රී ලාංකේය නව සමාජය යි. මේ නව සමාජය වූකලි එතෙක් ශ්‍රී ලාංකේය ජන සමාජය පුරා වසා පැතිරී සිටි රාජකාරී ක්‍රමය බ්‍රිතාන්‍ය ආධිපත්‍යය හේතුවෙන් බිඳ වැටීමත් සමඟ ම ව්‍යාප්ත වූ ධනවාදී අර්ථ ක්‍රමය යි. එහෙත් බහුතර විචාරක මතය වූයේ කොළඹ යුගයේ කාව්‍ය රචනාවලට ස්වභාව සෞන්දර්යය, ස්ත්‍රිය හා ප්‍රේමය වස්තු විෂය වූ බව යි. එය බොහෝ කාලයක් පටන් වග විභාගයකින් තොර ව පවත්වා ගෙන ආ ආකල්පයකි. එසේ වුව ද කොළඹ කවියට සමකාලීන සමාජය පාදක නො වන්නට මෙබඳු සමාජ විෂයක සංකල්පයක් වූ ස්ත්‍රී-පුරුෂ ස්තරායන මානය කොළඹ කවියෙන් හඳුනා ගැනීමට නොහැකි වනු ඇත. මේ අනුව පැහැදිලි වන්නේ කොළඹ කවිය හුදු රොමැන්ටික් කවියක් නො ව සමාජ ස්තරායනය වැනි සමාජ විද්‍යාත්මක සංකල්ප සමඟ ද සම්බන්ධ වන සමාජබද්ධ සාහිත්‍යාංගයක් වන බව ය.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ටියුඩර් සිල්වා, කාලිංග. (2005) කුලය, පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්. බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශකයෝ.

බුද්ධසිරි හිමි,කැටවල (2005) පියදාස සිරිසේනගේ කාව්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. කොළඹ : එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මනුරත්න, එම්. ජී. (2004) ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා පවුල. වරකාපොළ : ආරිය ප්‍රකාශකයෝ.

රාජකරුණා, ආනන්ද. (1962) උදානය. කොළඹ : පි. කේ. ඩී. සිරිවර්ධන පොත් වෙළෙඳ සැළ.

අබේසුන්දර, විමල්. (1990) ආනන්ද සම්ප්‍රවේදිතය. කොළඹ : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

අභයසුන්දර, ප්‍රණීත්. 'ස්තරායනය'. බී.ඒ. ටෙනිසන් පෙරේරා සහ තවත් අය (සංස්.) මහාචාර්ය නන්දසේන රත්නපාල සේවා මංජරී. රත්මලාන : විශ්වලේඛා ප්‍රකාශකයෝ.

කරුණාරත්න, කුසුමා හා තවත් අය. (1991) 'සිංහල ඉතිහාසයේ නූතන අවධිය (ක්‍රි.ව.1815-1948)'. ජී.පී.වී. සෝමරත්න, (සංස්.) ශ්‍රී ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, කොළඹ විශ්වවිද්‍යාලය : ඉතිහාසය හා දේශපාලනාංශය.

කුඩලිගම, ගීතනාත්. (2007) මන් බැඳි පන්හිඳ - එච්. එම්. කුඩලිගම. කොළඹ : සූරිය ප්‍රකාශකයෝ.

පෙරේරා, පී. බී. අල්විස්. (1950) දේදුන්න - 4 කාණ්ඩය, 3 කලාපය. කොළඹ.

බණ්ඩාර, ගුණරත්න. (2006) 'දළදා පෙරහැරෙන් නිරූපණය වන මහනුවර සමයේ සමාජ ස්තරායනය හා එහි නූතන වෙනස්වීම්.' වැලිවිටියේ ඤාණරතන හිමි සහ තවත් අය, (සංස්.) කොළඹ : අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව.

මැදවත්ත,ජයලතා. (2002) පියදාස සිරිසේනගේ නවකථා එකතුව - 1 වන කාණ්ඩය (තරුණියකගේ ප්‍රේමය ). කොළඹ : එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

වජිරඤාණ හිමි, ගුන්නැපාන. (1961) කපිල කවි 3. කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

A Dictionary of the Social Sciences, Ed. J. Gold, W.L. Kolb, The Free Press, New York, 1964

International Encyclopedia of the Social Sciences, vol. 15, Ed. David l. Sills, McMillan and free press, New York, 1968